DOI: 10.31357/fhssphd.2015.00089

# ‘සිංහල ශද්‍රාති ක්‍රමය’ හා එහි නූතන වෙනස්වීම්

24 FEB 2015

# "සිංහල ඥාති ක්‍රමය" හා එහි නූතන වෙනස්වීම්

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක දහයක් නියෝජනය වන පරිදි තෝරාගත් ගම් ප්‍රදේශ පහළොවකින් සමන්විතව සකස්කරගත් නියැදියක් ඇසුරින් සිදුකරන සමාජ විද්‍යාත්මක හා මානව විද්‍යාත්මක අධ්‍යයනයකි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත දර්ශනසූරී උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය

ලියාපදිංචි අංකය: GS/ M.Phil/ Anth/ 3552/ 08

නම: කේ. එම්. එස්. සමරසේකර

සමාජ විද්‍යා මානව විද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

## අපේක්ෂකයාගේ ප්‍රකාශය

මෙම පර්යේෂණ නිබන්ධය සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරුන් වන ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර හා ආචාර්ය ජයන්ත ජයසිරි යන මහත්වරුන්ගේ උපදේශකත්වය යටතේ මා විසින් ස්වාධීනව සම්පාදනය කරන ලද බවත්, මෙම විශ්වවිද්‍යාලයේ හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් කරන ලද්දක් නොවන බවත්, අවශ්‍ය කරුණු උපුටාගත් බවත්, නිසිසේ සඳහන් නොකළ පූර්ව ප්‍රකාශ කිසිවක් මෙහි අන්තර්ගත නොවන බවත් සහතිකකර ප්‍රකාශ කරමි. වාචික පරීක්ෂණයේ දී පරික්ෂකවරුන් විසින් පෙන්වාදුන් අඩුපාඩු සකස් කළ බවද සඳහන් කරමි.

පර්යේෂකයාගේ අත්සන:____________________

ලියාපදිංචි අංකය: GS/ M.Phil/ Anth/ 3552/ 08

## උපදේශකවරුන්ගේ සහතිකය

මෙම පර්යේෂණ නිබන්ධය අපගේ උපදේශකත්වය යටතේ සම්පාදනය කළ බව සහතික කරමු. එමෙන්ම වාචික පරීක්ෂණයේ දී පරික්ෂකවරුන් විසින් පෙන්වාදුන් අඩුපාඩු අපේක්ෂකයා විසින් සකස් කර ඇති බව ද සහතික කරමු.

ආචාර්ය ප්‍රණීත් අභය සුන්දර :____________________

ආචාර්ය ජයන්ත ජයසිරි :____________________

## අධ්‍යයනාංශ ප්‍රධාන තුමාගේ නිර්දේශය

නිර්දේශ කර ඉදිරිපත් කරමි

____________________

ඩබ්ලියු. එම්. ජයසුන්දර/ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

පිදුම...

ශ්‍රී ජයවර්ධනපුර
විශ්වවිද්‍යාලයේ
සමාජ විද්‍යා හා මානව විද්‍යා
අධ්‍යයනාංශය
බිහි කිරීමේ පුරෝගාමියා වූ ,

තම ජීවිතයෙන්
හතලිස් වසරකටත්
වඩා කාලයක්
එහි අභිවෘද්ධිය වෙනුවෙන්
කැප කළා වූ ,

අප හට
මහා ඇදුරාණන් වූ ,

එඩ්වින් කේ. ගණීහිගම
ගුරු පියාණෙනි ....!

ඔබටයි .

ස්තුතිය .......

- මෙම පර්යේෂණ නිබන්ධය සකස් කිරීමේ දී උපදෙස් හා අවවාද දෙමින් මා නිසි මගට යොමුකළ මහාචාර්ය බී. ඒ. ටෙනිසන් පෙරේරා සහ එඩ්වින් කේ. ගනිහිගම ගුරු පියවරුන්ට
- උපදේශකවරයෙකු, දුක් ගන්නා මිතුරෙකු ලෙස පසු පසින් සිට ඉලක්කය කරාම මා යොමු කල ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර නම් වූ සහෘද ගුරුවරයාට
- අධ්‍යයනාංශ ප්‍රධාන තුමා ඇතුළු වචනයකින් හෝ දිරිගැන් වූ ආචාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීන්ට
- වසර ගණනාවක් තිස්සේ දත්ත රැස්කිරීමේ, දත්ත සැකසීම හා විශ්ලේෂණයේ දී උපකාර කළ සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට
- මූලාශ්‍රය පොත පත ලබාගැනීමට උදවු කළ පුස්තකාලයේ සේවක මහත්ම මහත්මීන්ට
- ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී සහායදුන් විවිධ තරාතිරමේ නිළධාරීන් හා ගම් වාසීන්ට

මාගේ අවංක ආදර ස්තුතිය පුද කරමි.

පටුන


| | පිටු අංක |
|---|---|
| පළමු පරිච්ඡේදය: පර්යේෂණය හැඳින්වීම, මූලාශ්‍රය හා ක්‍රමවේදය. | **01 - 20** |
| **1.1.** පර්යේෂණ ගැටලුව. | **01** |
| 1.2. පර්යේෂණ ගැටලුව හැඳින්වීම. | **01 - 06** |
| 1.3. පර්යේෂණය හැඳින්වීම හා විෂය කෙෂ්ත්‍රය. | **06 - 12** |
| **1.4.** පර්යේෂණයේ අරමුණු. | **12** |
| **1.5.** පර්යේෂණයේ ක්‍රම වේදය (පර්යේෂණයේ ස්වභාවය, මූලාශ්‍රය, නියැදිය, දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය). | **12 - 18** |
| **1.6.** පර්යේෂණ සීමා. | **18 - 19** |
| **1.7.** පර්යේෂණ නිබන්ධයේ පරිච්ඡේද සැලැස්ම | **19 - 20** |
| දෙවැනි පරිච්ඡේදය: ඥාතිත්වය හා ඒ ආශ්‍රිත සංකල්ප. | **21 - 65** |
| **2.1.** ප්‍රවේශය. | **21** |
| **2.2.** ඥාතිත්වය හැඳින්වීම. | **21 - 25** |
| **2.3.** සමාජය, සංස්කෘතිය හා ඥාතිත්වය. | **25 - 29** |
| **2.4.** සමාජ ව්‍යුහය හා ඥාතිත්වය. | **29 - 32** |
| **2.5.** සමාජ සංවිධානය හා ඥාතිත්ව සංකල්ප. වර්ගීකරණ පදමාලාව (වර්ගීකරණ මූලධර්ම, ලෝකයේ විවිධ වර්ගීකරණ පදමාලා), සමාජ සම්බන්ධතා හා වර්ගීකරණ පදමාලාව, ව්‍යාජ/කල්පිත ඥාතිත්වය, ඥාතිත්ව අවරෝහණය. | **32 - 61** |
| **2.6.** අවරෝහණ සමූහ, අන්වය හා වංශය. | **62 - 65** |
| තුන්වැනි පරිච්ඡේදය: ඥාතිත්වය හා බැඳුනු සංකල්ප. | **66 - 111** |
| 3.1. ප්‍රවේශය. | **66 - 67** |
| **3.2.** විවාහය. විවාහ වර්ග, කුසඹුරු ඒකාබද්ධතාව, දේවර සරණය හා භාත්‍රි සරණය, අඹු මිල, අඹුව වෙනුවෙන් සේවය හා දෑවැද්ද, විවාහයෙන් පසු පදිංචිය. | **67 - 82** |
| **3.3.** පවුල (න්‍යෂ්ටික පවුල, බහු වෛවාහික පවුල, විස්තාරිත පවුල, බද්ධ පවුල.) | **82 - 98** |

**3.4.** ව්‍යභිචාරී තහංචි. **98 - 104**

**3.5.** කුලය. **104 - 111**

හතරවැනි පරිච්ඡේදය**:** ලෝකයේ විවිධ ඥාති ක්‍රම. **112 - 170**

**4.1.** ප්‍රවේශය. **112**

**4.2.** ඉන්දියානු නායර් **(Nayar)** සමාජයේ ඥාති ක්‍රමය. **112 - 125**

**4.3.** ඉන්දියාවේ තෝඩා **(Toda)** වරුන්ගේ ඥාතීත්වය. **125 - 134**

**4.4.** ට්‍රෝබ්‍රියන්ඩ් **(Trobriand)** දූපත් වාසීන්ගේ ඥාතිත්වය. **134 - 143**

**4.5.** අප්‍රිකාවේ නුවර් **(Nuer)** සමාජයේ ඥාතිත්වය. 143 - 153

**4.6.** ඕස්ට්‍රේලියාවේ අරුන්ටා **(Arunta)** සමාජයේ ඥාති ක්‍රමය. **153 - 158**

**4.7.** ඉන්දු ආර්ය හා ද්‍රවිඩියානු ඥාති ක්‍රම**:** **(**ඉන්දියානු ශිෂ්ටාචාරයේ විකාශණය හා විවිධ ඥාත්ත්ව ප්‍රවර්ග, ඉන්දු ආර්ය ඥාති ක්‍රමය, දකුණු ඉන්දියාවේ ද්‍රවිඩයානු ඥාති ක්‍රමය.**)** **158 - 170**

පස්වැනි පරිච්ඡේදය**:** සාම්ප්‍රදායික සිංහල ඥාති ක්‍රමය. **171 - 232**

**5.1.** ප්‍රවේශය. **171**

**5.2.** පැරණි සිංහල සමාජ සංවිධානය හා ඥාති ක්‍රමය. **171 - 176**

**5.3.** මධ්‍යකාලීන සිංහල සමාජ සංවිධානය හා ඥාති ක්‍රමය. **176 - 186**

**5.4.** මහනුවර රාජධානි සමයේ හා **20** වැනි සියවසේ මැද වනතුරු සිංහල සමාජ සංවිධානය හා ඥාති ක්‍රමය. **(**සිංහල සමාජයේ අවරෝහණය අනුප්‍රාප්තිය හා උරුමය, සිංහලයේ කුලය වංශය හා අවරෝහණ සමූහ, සිංහලයේ වාසගම හා ගෙදර සංකල්ප, සිංහල ඥාතිත්වය හා බැඳුනු විවාහ සම්බන්ධතා හා විවාහ වර්ග, සිංහල ඥාතිත්වය හා බැඳුනු පවුල් සම්බන්ධතා හා පවුල් වර්ග, සාම්ප්‍රදායික සිංහල ඥාති ක්‍රමයේ වර්ගීකරණ පදමාලාව**)** **186 - 232**

හයවැනි පරිච්ඡේදය**:** සිංහල ඥාති ක්‍රමයේ වත්මන් ප්‍රවණතා. **233 - 262**

6.1. ප්‍රවේශය **233**

6.2.පවුලේ සාමාජික සංඛ්‍යාව හා නූතන සිංහල සමාජයේ පරම්පරා සම්බන්ධතා 233 - 239

6.3. සිංහල විවාහ රටාවන් හි නව ප්‍රවණතා. 239 - 245

**6.4.** වත්මන් සිංහලයේ ඥාතිත්ව අවරෝහණය. **245 - 248**

**6.5.** ඥාති සම්බන්ධතා පිළිබඳ අවබෝධය. **248 - 252**

**6.6.**පවුලේ උත්සව අවස්ථා, එදිනෙදා ජීවිතය හා ඥාතිත්ව සම්බන්ධතා. **252 - 258**

**6.7.**වත්මන් සිංහල සමාජයේ ඥාතිත්ව සම්බන්ධතාවන් හි යථා ස්වභාවය. **258 - 262**

හත්වැනි පරිච්ඡේදය: සමාලෝචනය හා නිගමන. **263 - 274**

**7.1.** ප්‍රවේශය **263**

**7.2.** සමාලෝචනය **263 - 272**

**7.3.** නිගමන **272 - 274**

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය **275 - 292**

## නිබන්ධයේ අන්තර්ගත වගු

පිටු අංක


**1.5.A.** ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා තෝරාගත් නියැදිය. 15

**6.2.A.** පවුල් ඒකකයක සාමාජික සංඛ්‍යාව. 234

**6.2.B.** පවුල් ඒකකයක පරම්පරා සංඛ්‍යාව. 235

**6.2.C.** මහ ගෙදර සංකල්පයේ වර්තමාන තත්ත්වය. 237

**6.3.A.** සිංහල සමාජයේ විවාහ වර්ග. 240

**6.3.B.** ඇවැස්ස ඥාති සහෝදර විවාහයේ අතීත හා වර්තමාන තත්ත්වය. 243

**6.4.A.** අවරෝහණය/ දෙපළ උරුමය (ග්‍රාමීය). 247

**6.4.B.** අවරෝහණය/ දෙපළ උරුමය (සමස්ත නියැදිය). 247

**6.5.A.** ඥාති සම්බන්ධතා පිළිබඳ අවබෝධය (ග්‍රාමීය). 249

**6.5.B.** ඥාති සම්බන්ධතා පිළිබඳ අවබෝධය (සමස්ත නියැදිය). 250

**6.6.A.** නියැදි ප්‍රදේශය අනුව එදිනෙදා ජීවිතට ඥාතීන් සම්බන්ධ කර නොගන්නා ප්‍රතිශත හා ඊට දක්වන හේතු. 255


## නිබන්ධයේ අන්තර්ගත රූප සටහන්


**2.2.a/2.2.b**. පුද්ගලයන් දෙදෙනෙකු එකිනෙකා ඥාතීන් වන ආකාරය 23

**2.5.1. A.** සුඩාන (Sudanese) ඥාතිත්ව රටාව 40

**2.5.1. B.** ඉරාකුයිස් (Iroquois) ඥාතිත්ව රටාව 41

**2.5.2. C.** එස්කිමෝ (Eskimo) ඥාතිත්ව රටාව 43

**2.5.1. D.** ක්‍රෝ (Crow) ඥාතිත්ව රටාව 45

**2.5.1. E.** ඔමාහා (Omaha) ඥාතිත්ව රටාව 47

**2.5.1. F.** හවායියන් (Hawaiian) ඥාතිත්ව රටාව 49

**2.5.2. A.** ඥාති සම්බන්ධතා හා වර්ගීකරණ පද 51

**2.5.2.B.** Ego ගේ ප්‍රාථමික හා ද්විතීයික ඥාතින් 52

**2.5.4. A.** මාතෘ හා පිතෘ පාර්ශ්වීය ඒක රේඛීය අවරෝහණය 59

**2.5.4. B.** ද්වි පාර්ශ්වීය අවරෝහණය 60

**2.5.4. C.** ද්විත්ව අවරෝහණය 61

**3.3. A** පුද්ගලයා ජීවිත කාලය තුළ සම්බන්ධ කරගන්නා පවුල් වර්ග 87

**4. 2. A** නායර් අවරෝහණ සමූහයේ බද්ධ පවුල් ඇතුළත් ඥාතිත්ව ව්‍යුහය 119

**4. 3. A** තෝඩා ඥාතිත්ව රටාව 133

**4. 4. A** ට්‍රෝබ්‍රියන්ඩ් ඥාතිත්ව රටාව 142

**4. 5. A** නුවර් ගෝත්‍රයේ සමාජ ව්‍යුහය 145

**5.4.A** මහනුවර සෙංකඩගල රාජධානියේ රජ පවුලේ උරුමය හා අනුප්‍රාප්තිය 188
**5.4.1.A** යටත්විජිත සමයේ සිංහලයේ දේපළ උරුමය සිදුවූ ආකාරය 191
**5.4. 5. A** සිංහල මහා පවුල. 218
**5.4. 6. A** සිංහල සමාජයේ ඇවැස්ස හා සමාන්තර ඥාතින් 224
**5.4. 6. B** සිංහල ඥාතිත්ව වර්ගීකරණය 225
**5. 4. 6. C** සිංහල සමාජයේ ව්‍යභිචාරී සම්බන්ධතා 231
**6.2. a.** පවුල් ඒකකයක සාමාජික සංඛ්‍යාව. 234
**6.2. b.** පවුල් ඒකකයක පරම්පරා සංඛ්‍යාව. 236
**6.2. c.** මහ ගෙදර සංකල්පයේ වර්තමාන තත්ත්වය. 237
**6.2. d.** පරම්පරා සංඛ්‍යාව හා මහගෙදර තත්ත්වය සන්සන්දනාත්මකව. 238
**6.2. e.** සජීවී සම්බන්ධතා පවත්වන පරම්පරා ගණන. 239
**6.3. a.** සිංහල සමාජයේ විවාහ වර්ග. 241
**6.3.b.** ඇවැස්ස ඥාති සහෝදර විවාහයේ අතීත හා වර්තමාන තත්ත්වය. 244
**6.3.c.** ඇවැස්ස ඥාති සහෝදර විවාහය පිළිබඳ අදහස්. 244
**6.4.a.** අවරෝහණය/ පෙළපත හා සමාජ තත්ත්වය. 246
**6.4.b.** අවරෝහණය/ දෙපළ උරුමය (සමස්ත නියැදිය). 248
**6.5.a.** ඥාති සම්බන්ධතා පිළිබඳ අවබෝධය. 251
**6.5.b.** නූතන සිංහල ඥාති ක්‍රමයේ වැරදි සමාජ සම්බන්ධතා ක්‍රම. 252
**6.6.a.** පවුලේ උත්සව අවස්තා සඳහා ඥාතීන් සම්බන්ධ කරගැනීම. 253
**6.6.b.** එදිනෙදා ජීවිතයේ කාර්යයන් සඳහා ඥාතීන් සම්බන්ධ කරගැනීම. 254
**6.6.c.** නියැදි ප්‍රදේශය අනුව එදිනෙදා ජීවිතට ඥාතීන් සම්බන්ධ කර නොගන්නා ප්‍රතිශත හා ඊට දක්වන හේතු. 255
**6.6.d.** නියැදි ප්‍රදේශය අනුව කිසියම් හෝ ආකාරයකින් ඥාති සම්බන්ධතා නොපැවැත් වීම හා ඊට හේතු. 256
**6.6.e.** එදිනෙදා ජීවිතයේ ඥාති සම්බන්ධතා නියැදි ප්‍රදේශ අනුව. 257
**6.6.f.** එදිනෙදා ජීවිතයේ ඥාති සම්බන්ධතා සමස්ත නියැදිය. 257
**6.7.a.** ඥාති සම්බන්ධතා සක්‍රියව පවතී. 259
**6.7.b.** ඥාති සම්බන්ධතා තරමක් දුරට සක්‍රියව පවතී. 260
**6.7.c.** නූතන ඥාති සම්බන්ධතා සක්‍රිය නැත. 262

## පර්යේෂණ නිබන්ධයේ සාරාංශය:

ඥාතිත්වය විශ්වීය සමාජ සම්බන්ධතා වර්ගයකි. එය සමාජයේ පවතින සංස්කෘතිය මඟින් පෝෂණය වී නිර්වචනය වී ඇත. ඒ නිසා කිසියම් සමාජ ක්‍රමයක් තේරුම්ගැනීමේ දී ඥාතිත්වය පිළිබඳ අධ්‍යයනය ඉතා වැදගත් වේ. නායර්, නුවර්, තොඩා, ට්‍රෝබියන්ඩ් හා අරුන්ටා මෙන්ම හින්දු හා ද්‍රවිඩ ඥාති ක්‍රම පිළිබඳ විමසීමේ දී එය මනාව පැහැදිළි වේ. ලොව පුරා ඥාති ක්‍රම පදනම් කරගනිමින් ලෙවිස් එච්. මෝගන් ගේ සිට වර්ථමානය දක්වා අධ්‍යයන රාශියක් සිදුවී ඇත. එමඟින් සමාජ හා මානව විද්‍යාවන්හි න්‍යාය හා සංකල්ප වර්ධනයට ලැබුණේ ඉතා ඉහළ දායකත්වයකි. වර්ගීකරණ පදමාළාව, අවරෝහණය, අවරෝහණ සමූහ, වංශය හා කුසඹුරු ඒකාබද්ධතාව ආදී ඥාතිත්ව සංකල්ප මෙන්ම ඥාතිත්වය හා බැඳුණු පවුල, විවාහය, කුලය හා ව්‍යභිචාරී තහංචි මානව සමාජයේ ස්වභාවය, එහි ව්‍යුහය හා සංවිධානය තීරණය කරන සාදක වේ.

සිංහල සමාජයේ විකාශනය අධ්‍යයනයේ දී මෙතෙක් ඥාතිත්වය ප්‍රමුඛ සංකල්පයක් ලෙස ගෙන අධ්‍යයනයට ලක්නොවීම බලවත් අඩුපාඩුවකි. එම අඩුව සපුරාළීමට දායකවීම මෙම අධ්‍යයනයේ ප්‍රමුඛ අරමුණකි. සිංහල සමාජයේ ආරම්භ යේ සිට විසිවැනි සියවස දක්වාම එහි ස්වභාවය තීරණය වීමට හින්දු හා ද්‍රවිඩ යන ඉන්දියානු සමාජයන්හි බලපෑම ප්‍රභලව ලැබී ඇත. එම කාරණය සිංහල ඥාති ක්‍රමයේ විකාශණය විමසීමෙන් හොඳින් අවබෝධ කරගත හැකියි. එම බලපෑම් මධ්‍යයේ වුවද තමන්ට අනන්‍ය ඥාති ක්‍රමයක් පවත්වාගෙන එන්නට සිංහලයා සමත් වී ඇත. එමෙන්ම එය සාම්ප්‍රදායික සිංහල සමාජයේ පැවැත්ම සඳහා මධ්‍යගත කාර්යභාරයක් ඉටුකර ඇත.

යටත්විජිතකරණය හා ඉන්පසු බටහිරකරණය ආදී සමාජ වෙනස්වීමේ බලවේගයන් නිසා සිංහල සමාජ සංවිධානය මෙන්ම එහි මධ්‍ය ලක්ෂය බඳු වූ සිංහල ඥාති ක්‍රමය විශාල වෙනසකට ලක්විය. වත්මන් සිංහල සමාජයේ එවකට ඥාතිත්වයට හිමිව තිබූ ප්‍රමුඛස්ථානය වෙනත් සම්බන්ධතා වර්ග විසින් ආක්‍රමණය කර ඇත. සිංහල ඥාති පද වෙනුවට ඒවායෙහි සැබෑ අර්ථය අසලකින්වත් නොයන ඉංග්‍රීසි පද මෙන්ම ඥාතිත්වය මඟින් වට කරන ලද සමාජ හර පද්ධතිය වෙනුවට බටහිර හර පද්ධති ආදී වූ වෙනස්කම් රාශියක් වත්මන් සමාජයේ දක්නට ලැබෙයි. එය සමාජයේ සුරක්ෂිතාවට හා පැවැත්මට බාධාවක් වේ. සමාජ හා මානව විද්‍යාර්ථීන්ගේ වගකීම වනුයේ මේ ස්වභාවය හොඳින් අධ්‍යයනය කර රජය හා වෙනත් සමාජ සංවර්ධන ආයතන ඥාති සම්බන්ධතා සමාජයේ යලි ස්ථාපිත කිරීමේ වැඩපිළිවෙලක් කරා යොමුකිරීමයි. ඒ සඳහා පහසුකම් හා අවස්ථා ලබාදීම රජයක් සතු වගකීමයි.

## පළමුවැනි පරිච්ඡේදය

## හැඳින්වීම මූලාශ්‍රය හා ක්‍රමවේදය

**1.1.** පර්යේෂණ ගැටලුව**:**

ලොවපුරා මානව සමාජයන් හි පැවැත්ම හා මනා ක්‍රියාකාරීත්වය සඳහා ඒ ඒ සමාජ ව්‍යුහයන් හි මධ්‍යගත කාර්යභාරයක් මානව ඉතිහාසය පුරාම ඥාතිත්වය මඟින් සිදුකර ඇත. ශ්‍රී ලංකාවේ සිංහල සමාජයට ද එය පොදු තත්ත්වයකි. නමුත් වර්තමාන ශීඝ්‍ර සමාජ සංස්කෘතික වෙනස්වීමේ ක්‍රියාවළියත් සමඟ ඥාති සම්බන්ධතා ගිලිහෙමින් පවතී. එම තත්ත්වය සමස්ත සමාජයම එකිනෙකා අතර යහපත් සම්බන්ධතා පවත්වාගැනීමට නොහැකිව අර්බුදයට ලක්වීමට හේතු වේ. මෙම පර්යේෂණයෙන් සිදුවන්නේ ඒ ගැටලුව විමර්ෂණය කිරීමයි.

**1.2.** පර්යේෂණ ගැටලුව හැඳින්වීම**:**

මානව සමාජය, ඒ හා බැඳුණු සංස්කෘතිය මිනිසාගේ ආරම්භයේ සිටම ක්‍රමයෙන් වෙනස් වෙමින්, වර්ධනය වෙමින් අද පවතින තත්ත්වය දක්වා පැමිණ ඇත. සමාජයේ හා සංස්කෘතියේ මෙම ස්වභාවය තේරුම් ගැනීම සඳහා මානව විද්‍යාඥයෝ ඊට සම්බන්ධ සංකල්ප අධ්‍යයනය කරති. ඥාතිත්වය, සමාජ සම්බන්ධතාවයක් ලෙස හා සංස්කෘතික අගනාකම් ධර්මතා සමුදායකින් සමන්විත වූවක් ලෙස ගෙන මානව විද්‍යාව ආරම්භයේ සිටම අධ්‍යයනයට ලක්වූ සංකල්පයකි.

සිංහල සමාජය පිළිබඳ **19** හා **20** සියවස් හි දී අධ්‍යයනය කළ බොහෝ විද්වතුන් සමාජ විද්‍යාත්මක, මානව විද්‍යාත්මක හා ඓතිහාසික දෘෂ්ටිකෝණ යන්ගෙන් සිංහල ඥාති ක්‍රමය පිළිබඳ අදහස් ඉදිරිපත් කර ඇත. ඊ. ආර්. ලච් **(E.R. Leach),** නූර් යාල්මාන් **(Nur Yalman),** එස්. ජේ. තම්බයියා **(S.J. Tambiah)** යන අය එහි දී විශේෂයෙන් සඳහන් කළ යුතුය. ලීච් විසින් **1951** සිට **1961** දක්වා ***Pul Eliya*** **(1961)** ඇතුලු කෘති සහ පර්යේෂණ ලිපි කිහිපයක් ද, යාල්මාන් **1960** සිට **1968** දක්වා ***"The Structure of Sinhalese Kindred: a re-examination of the dravidian terminology", in American Anthropologist*** **(1962),** ***Under The Bo Tree*** **(1971/1967)** ආදි වූ කෘතී සහ පර්යේෂණ ලිපි කිහිපයකින් ද, තම්බයියා විසින් **1958** සිට **1973** දක්වා ***"The Structure of Kinship and Relationship to Land Possession and Residence in Pata Dumbara, Central Ceylon" in Journal of Royal Anthropological Institute*** **(1958),** ආදී වශයෙන් පර්යේෂණ කෘති සහ ලිපි හයකින් පමණ ද ශ්‍රී ලංකාවේ සිංහල ඥාතිත්වය පිළිබඳ අධ්‍යයනය පෝෂණය කර ඇත. මේ සියලු අධ්‍යයන මගින් සාම්ප්‍රදායික සිංහල සමාජයේ පැවැත්ම තීරණය

කිරීමේ මධ්‍යගත කාර්යභාරයක් ඥාතිත්වය **(Kinship)** මඟින් ඉටු කළ බව පෙන්වා දෙයි. මෙය ලෝකයේ බොහෝ ගැමි හා ප්‍රාථමික සමාජ වලට පොදු තත්ත්වයකි. කාර්මීකරණය හා නාගරීකරණය සියවස් කිහිපයක් තිස්සේ විශ්වීය සමාජ වෙනස්වීමේ කාරක ලෙස ක්‍රියාත්මක වෙයි. නවීකරණය හා ගෝලීයකරණය ද දශක ගණනාවක සිට මෙම වෙනස වඩාත් තීව්‍ර කර ඇත. ඒ අනුව ඥාතිත්වය වැනි සාම්ප්‍රදායික සමාජයට පදනම සැපයූ ආයතන විශාල වශයෙන් වෙනස්වීමට ලක්වෙමින් තිබේ. එමිල් ඩුර්කයිම් **(Emile Durkheim),** පර්ඩිනන්ඩ් ට'නියේස් **(Ferdinand Tonnies),** රොබට් රෙඩ්ෆීල්ඩ් **(Robert Redfield)** වැනි සමාජ හා මානව විද්‍යාඥයින් ඥාතිත්වය වැනි ප්‍රාථමික සමාජ ආයතන හා සමාජ පැවැත්ම අතර ඇති සම්බන්ධය විමසුමට ලක්කර ඇත. මේ සියලුදෙනා මේ පිළිබඳව විග්‍රහ කරන්නේ පැවති හා පවතින සමාජයන් හි වෙනස අධ්‍යයනය කරමින් හා එම වෙනස්කම් ඇතිවීමට සමාජ ආයතන දක්වන දායකත්වය මෙන්ම සමාජ වෙනස්වීමත් සමඟ ඥාතිත්වය වැනි සමාජ ආයතන වෙනස්වන ආකාරය විමසීමට ලක්කරමිනි.

ඒ විග්‍රහ අතුරින් ඩුර්කයිම් ගේ විග්‍රහයන්ට ප්‍රමුඛස්ථානයක් ලැබේ. ඔහුගේ ***The Division of Labour in Society*** **(1997/1893)** නම් කෘතියෙන් උත්සාහ කරන්නේ කාලයක් තිස්සේ සමාජයක් තුළ සමාජ ඒකාබද්ධතාවයේ ස්වරූපය වෙනස් වෙමින් පැමිණි ආකාරය විස්තර කිරීමටයි. එකිනෙකට වෙනස් වූ මූලයන් මත පැවති හා පවතින සමාජයේ ස්වරූපයෙන් වෙනස්වූ ඒකාබද්ධතාවන් ඇති බව ඩුර්කයිම් පෙන්වා දෙයි. එමෙන්ම සමාජය පාලනය කරන නීති රීති මූලධර්මයන් නිපදවන්නේ සමාජ ඒකාබද්ධතාව මඟිනි. ඒකාබද්ධතාවයේ ස්වරූපය මත විවිධ වර්ගයන් හි රීතින් ගොඩනැගේ. රීතින් යනු සමාජ ඒකාබද්ධතාවයේ තරම පෙන්වන නිර්ණායකයකි **(Durkheim, 1997/1893: 68).** එමෙන්ම සමාජ ඒකාබද්ධතාවයේ පදනම වන්නේ ඉහත රීතීන් මත ඇති වූ ශ්‍රම විභජන පද්ධතියයි. සමාජය සමස්තයක් ලෙස එකට ඒකාබද්ධ කර තබන ආකාරය හා පුද්ගලයා හා සමාජය අතර ඇති සම්බන්ධතාවයේ ස්වරූපය මත දෙආකාරයක ඒකාබද්ධතාවක් පවතින බව ඔහු පෙන්වා දෙයි.

ඒවා නම් යාන්ත්‍රික ඒකාබද්ධතාව **(Mechanical Solidarity)** හා ඓන්ද්‍රීය ඒකාබද්ධතාව **(Organic Solidarity)** යයි. මේ අතරින් යාන්ත්‍රික ඒකාබද්ධතාව යනු කිසියම් සමාජයක වෙසෙන්නවුන් එකිනෙකාගේ සමානකම හෝ සමානාත්මතාව නිසා ඇති වන සාමූහික සවිඥ්ඥාණයේ **(Collective Consience)** ඉහළම තත්ත්වයකි **(Durkheim, 1997/1893: 84).** මේ තත්ත්වය දැකිය හැක්කේ මුල්කාලීන සරල ප්‍රාථමික හෝ සාම්ප්‍රදායික ගැමි සමාජ වලයි. ප්‍රබල සම්ප්‍රදායන් හා සමාජ පිළිගැනීම් මත පදනම් වූ සදාචාර ධර්මතා මඟින් එම සමාජයන්හි සාමාජිකයෝ එකට බැඳී ජීවත් වූහ. එය සාම්ප්‍රදායිකව සමාජ ඒකාබද්ධතාව ආරක්ෂාවීමට බලපෑවේය. එම සමාජ

සංවිධානයන් හි බලය, ආධිපත්‍යය, තත්ත්වය කාර්යභාරය, සමාජ පාලන ක්‍රමය තීරණය වූයේ විශේෂයෙන් ඥාතිත්ව මූලධර්ම මතයි. ඩුර්කයිම් මෙය යාන්ත්‍රික ඒකාබද්ධතාව **(Mechanical Solidarity)** ලෙස හඳුන්වයි. යාන්ත්‍රික ඒකාබද්ධතාව ඇතිවන්නේ සරල ශ්‍රම විභජනය පදනම් කරගෙනය. පවුල් ඒකකයෙහි සරල වැඩ බෙදීමක් තිබුණ ද**,** පුද්ගලයා සහ සමූහය අතර බැඳීම වැඩි නිසා පැහැර හැරීම්**,** නොසලකා හැරීම් හා අනවශ්‍ය තරගය ඇති නොවේ **(Durkheim, 1997/1893: 31-64).** මෙම තත්ත්වය ශක්තිමත් කළේ ඥාති සම්බන්ධතා මඟිනි.

මෙබඳු සමාජ ක්‍රමයක සමජාතිත්වය ඇති අතර එදිනෙදා ජීවිතයේ දී එකිනෙකා යෙදී සිටින්නේ එක සමාන කාර්යයන් හිය. සියලුදෙනා සතුවන්නේ සමාන අත්දැකීම් හා දැනුමක් ය. එමෙන්ම එකිනෙකාගේ චර්යාවන්, චින්තනය, ධර්මතා අගනාකම් හා වටිනාකම් සමාන වේ. ඩුර්කයිම් තවදුරටත් කියන ආකාරයට පුද්ගලයෙකුගේ සමාජ ජීවිතය ගොඩනැඟෙන ආකාර දෙකකි. හෘදය සාක්ෂියේ හා හොඳ නරක පිළිබඳ හැඟීමේ සමානකම සහ ශ්‍රම විභජනය එම ආකාර දෙකයි. මේ තුළින් යම් පුද්ගලයෙකු සමාජයේ සාමාජිකයෙකු බවට පත්වේ. හේතුව ඔහු තුළ පුද්ගලිකත්වය පිළිබඳ හැඟීමක් ඇතිවීමට ඉඩක් නොතිබීමයි. ඒ අනුව යාන්ත්‍රික ඒකාබද්ධිත සමාජයේ යමෙකුට හාත්පසින්ම සමාන වන එකිනෙකාට සමානයන් සිටින සමාජයක ඕනෑම තැනකට පිරිද්දිය හැකි ඒකකයක් බවට පත් වේ. අනෙක් අතට සරල ශ්‍රම විභජනයක් තුළින් යමෙක් අයත් සමූහයේ අන් අයගෙන් වෙන්කර හඳුනාගත හැකිවන පරිදි පුද්ගලික ක්‍රියාකාරීත්වයක් සහිත චරිතයක් ද බිහි වේ. අන් අයගෙන් ඔහු සුවිශේෂ වන නිසා ඔහු හා සමූහය එකිනෙකා මත යැපෙයි. මෙවන් පුද්ගල එකතුවකින් සිදුවන්නේ සමාජය ප්‍රබලත්වයට පත්වීමකි.

මෙබඳු සම්ප්‍රදායික සමාජයක් ට'නියේස් හඳුන්වන්නේ ප්‍රජාවක් **(Community)** ලෙසයි **(http://www.roebuckclasses.com/socialtheory/resources/thmisc1.htm#LINTON:2013.11.20)**. ප්‍රජාවක් යනු පොදු පැවැත්මක් හා පොදු දේපළ භුක්තියක් ඇති කණ්ඩායමකි. මෙය ඉතා සමීප කුළුපග සම්බන්ධතා ඇති අන්‍යෝන්‍ය වශයෙන් දැන හඳුනාගත් පුද්ගල එකතුවකි. මෙබඳු සමාජ ක්‍රමයක එකිනෙකා අතර බැඳීමේ තරම ට'නියේස් විස්තර කරන්නේ ගෙමයින්ෂාෆ්ට් **(Gemeinschaft)** සංකල්පයෙනි **(Kendall, 2006: 124)**. ඥාතිත්වය හා අසල්වැසි බව මත එක්වූ, එම බැඳීම පවත්වාගෙන යාම සාමූහික අරමුණ කරගත් කණ්ඩායමකි. ප්‍රාග් නූතන සමාජයේ තිබූ පවුල් සම්බන්ධතා හා අසල්වැසිභාවය ගෙමයින්ෂාෆ්ට් සම්බන්ධතාවට ආදර්ශයක් ලෙස ට'නියේස් දක්වයි **(Tonnies, 2001/1936: 22 - 51)**. උදාහරණයක් මඟින් එය පැහැදිලි කරන ට'නියේස් ඥාතිත්වයේ හරය නිවසක බිත්ති හතර තුළ හෝ භෞතික සමීපතාව තුළ සිරගත කළ නොහැකි බව කියයි. භෞතිකව ඇති සමීපතාව හෝ දුරස්ථ බව නොසලකා

පැහැදිලි සජීවී බවක් හා තදබල සමීපතාවක් ඇති පුද්ගලාන්තර සම්බන්ධතාවක් තුළ ඥාතිත්වය සජීවී වෙයි. සිතින් මවාගත් සමීප බව මත පොදු ක්‍රියාකාරකම් වල නිරත වෙමින්, ඥාතින් එකිනෙකා මතකයන් සමඟ ශක්තිමත්ව බැඳී සිටියි.

ට'නියේස් තවදුරටත් පෙන්වාදෙන්නේ ප්‍රාග් නූතන මානව සමාජය හැඩගැසුණේ ප්‍රජාව නම් සමාජ සංවිධානය ලෙස වන අතර එහි තිබුණේ ජීව විද්‍යාත්මක හා ඉන් එහා ගිය පවුල් බැඳීමකි. යම් ආකාරයකින් කිසියම් පුද්ගල පිරිසකට ප්‍රජාවක් ලෙස ඒකාබද්ධ විය හැකි නම් ඔවුන්ට පහසුවෙන් ජීවත් වීමේ ඉඩකඩ පමණක් නොව පොදු ඉලක්ක සපුරා ගැනීමේ හැකියාව ද ලැබේ. රොබට් රෙඩ්ෆීල්ඩ් **(Robert Redfield)** මෙබඳු සමාජ ක්‍රමයක් හඳුන්වන්නේ චූල ප්‍රජාවක් **(Little Community)** ලෙසයි. එහි ඇත්තේ චූල සම්ප්‍රදායයි **(Little Tradition).** එනම් බාහිර සංකීර්ණ සමාජයේ බලපෑමට ලක් නොවූ, ආර්ථික හා සමාජ සංස්කෘතික සමජාතිත්වයක් සහිත, සම්ප්‍රදායික බැඳීම් වලින් සමන්විත ජන සංස්කෘතියක් ඇති සාපේක්ෂව කුඩා ජන සමූහයකි **(Redfield: 1956: 68 - 72)**.

මෙසේ සමාජ හා මානව විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රබල මතවාදයන් තුළින් විග්‍රහයට ලක් කළ සාම්ප්‍රදායික සමාජයේ ස්වභාවය සැමදා එකසේ පවතින්නේ නැත **(Obeysekere, 1963: 139 - 141)**. රෙඩ්ෆීල්ඩ් පෙන්වාදෙන්නේ මෙබඳු සමාජ ක්‍රමයක් බාහිර සංකීර්ණ සමාජයේ බලපෑමට ලක්වීම වැළැක්විය නොහැකි බවයි. බාහිර සංකීර්ණ මහා සමාජයේ **(Mass Society)** ඇති මහා සම්ප්‍රදාය **(Great Tradition)** චූල සමාජයට ඇතුළු වී එහි පවතින සමාජ තත්ත්වයන් සමඟ සම්මිශ්‍රණය වී සමාජ ආයතන හා සම්බන්ධතාවන් හි වෙනසක් ඇතිකරයි. ඩුර්කයිම් සඳහන් කරන ආකාරයට මෙබඳු සමාජයක ඥාතිත්වය වැනි ප්‍රාථමික සබඳතා වලට මුල් තැනක් හිමි නොවේ. පාලනය විශ්වීයව ලබාගත් ලිඛිත නීතිය හා නිළ සම්බන්ධතා මඟින් සිදුවේ **(Kendall, 2006: 123 - 124).** අධිකාරීත්වය හා බලය ලැබෙන්නේ සුවිශේෂ තත්ත්වයන් ගෙනි. සාමූහික සමූහයක පැවති ප්‍රබල පොදු පෞරුෂය වෙනුවට පුද්ගලික පෞරුෂය ප්‍රබල වී නිතරම පුද්ගලිකත්වයට ප්‍රමුඛස්ථානයක් ලැබේ. එතෙක් පැවති සමාජ බලයට ඉහළින් පුද්ගලික බලය පැමිණේ **(Durkheim, 1997/1893: 37).**

මෙබඳු සමාජ ක්‍රමයක ස්වභාවය තවදුරටත් විග්‍රහ කරන ඩුර්කයිම් කිසියම් සමාජයක් එහි ප්‍රමාණය හා ගහණය තමා විසින්ම තීරණය කරන, නීති හා රෙගුලාසි මනුෂ්‍යයාට ඉහළින් ක්‍රියාත්මක වන, විද්‍යා තාක්ෂණ හා ආර්ථික අංශයන් හි වර්ධනයක් ඇති, ජීවත්වීම සඳහා නව එකඟතා ගොඩනැඟෙන, පුද්ගලයා තුළ විශේෂායනයක් ඇතිවන මේ තත්ත්වය ඓන්ද්‍රීය ඒකාබද්ධතාව **(Organic Solidarity)** ලෙස හඳුන්වයි. මෙම ඒකාබද්ධතාව සත්වයකුගේ ශරීරයේ ඒ ඒ ඉන්ද්‍රීයයන්ගේ සුවිශේෂ බව හා ඒවායෙහි